<u>‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාව</u>
<u>‘පුරෙජාත  ප්‍රත්‍යය’</u>
<u>07.03.2019</u>

<u>නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්දධස්ස</u>
<u>නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්දධස්ස</u>
<u>නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්දධස්ස</u>

තුන්ලෝකාග්‍රවූ භාග්‍යවත්වූ අරිහත්වූ සම්මා සම්බුදුපියාණන් වහන්සේට මෝහ අන්ධකාරයෙන් වෙලාගෙන සිටියාවූ ලෝකයට ප්‍රඥා ආලෝකය පහළ කරමින් ප්‍රඥා ආලෝකය විහිදුවමින් මෝහ අන්ධකාරය නසමින් පහළ උනාවූ ශාන්ති නායක සම්මා සම්බුදුපියාණන් වහන්සේට සියලුම සත්වයන් කෙරෙහි පතලාවූ මහා කරුණා ගුණය පෙරදැරිකරගෙන ශාන්තවූ විශිෂ්ටවූ නිර්මලවූ ශ්‍රී සද්ධර්මය වදාළාවූ නිරන්තරයෙන්ම නිර්වාණ ධාතුවට ගමන් කරන ආකාරය දකින්ට කැමති උනාවූ ඒ සඳහා කරුණාවෙන් පිහිට උනාවූ ශාන්ති නායක සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ නිර්වාණ ධාතුවට ගමන් කරීමට උපනිශ්‍රය වන්නාවූ පූර්වභාග ප්‍රතිපදාව වශයෙන් බෝධිපාක්ෂික ධර්මයන්ගෙන් සමලංකෘත වූ ඒ වාගේම ලෝකෝත්තර ගුණයේ පිහිටියාවූ සත්වයන්ගේ සිත් නිවා සනසාලන්නාවූ සත්වයන්ට සංසාර දුකෙන් මිදීමට පිහිට වන්නාවූ ඒ උතුම් වූ ශ්‍රී සත්ධර්මයට මම නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම්වූ බුද්ධානුසාසනාවේ පිහිටා දේසනාකරන ලද ශ්‍රී සත්ධර්මයේ ගමන්කොට නිවනින් නිවීගියා වූ සිත් ඇත්තා වූ අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් බුද්ධ රත්නයේ ආනුභාව බලයෙන් ධර්ම රත්නයේ ආනුභාව බලයෙන් සංඝ රත්නයේ ආනුභාව බලයෙන් බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයට චිත්ත ප්‍රසාදනීය ආකාරයෙන් ගුණ සිහිපත්කොට වන්දනා කිරීමේ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් ඒකාන්තයෙන්ම අද දවසේ මේ පිංවතුන්ට කියලා දෙන්න බලාපොරොත්තු වෙන ධර්ම කාණ්ඩය ධර්ම කොට්ඨාසය හැම කෙනාටම හොඳින් වැටහේවා. තේරුම් ගන්න ලැබේවා! අවබෝධ වේවා! ඒ සඳහා ධර්ම මනසිකාරය පිහිටාවා. සැම දෙනාගේම සිත්වලට සිහිය නුවණ යෝනිසෝමනසිකාරය අවධිවී මේ කියලා දෙන කරුණු ටික හොඳින් තේරුම් අරගෙන ධර්ම මාර්ගයේ ගමන්කොට සැමදෙනාටම උතුම් අමාමහ නිවනින් නිවී

සැනසෙන්න මේ උතුම් ප්‍රතිපදාව ධර්මය ඇසීම හේතු වාසනා වේවා! කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. ප්‍රාර්ථනා කරනවා.

අපි මේ දවස්වල අවස්ථාව ලැබෙන පරිදි මේ කථා කරන්නේ සාකච්ඡා කරන්නේ අති ගාම්භීර වූ ධර්ම පාරාසයක්. මේ පින්වතුන් මේ වාගේ දෙයක් කරන්න හිත යෙදුවා කියන එකත් ආශ්චර්ය ධර්මයක්. මේවාගේ දෙයක් ආරම්භ කළා කියන එකත් ආශ්චර්ය ධර්මයක්. අවුරුදු කීපයක් තිස්සේ මේ දහම් කථාව කරගෙන ආවා කියන එකත් පුදුම එළවන කාරණයක්. හේතුව, තථාගත බුදුරජාණන් වහන්සේගේ ගැඹුරු වූ සූක්ෂම වූ වේගවත් වූ ඥානයෙන් දැකගෙන දැනගෙන අවබෝධ කරගෙන නුවණින් අගතැන්පත් සාරිපුත්ත මහරහතන් වහන්සේ ප්‍රධාන කොටගෙන දේශනා කොට වදාළාවූ මේ හේතු ඵල ධර්මයේ ගැඹුරු තැනක් මේ පට්ඨාන කථා විස්තරයෙන් කෙරෙන්නේ. ඉතින් මේ පට්ඨාන දේශනාවට අපි කල් ඇතුවම තික මාතිකාව කළා ධම්ම සංඝණී ප්‍රකරණයේ. ඒකෙම දුක මාතිකාව කළා, කාලයක්. ඒ කොටස් ටික අවසන් කරලා පදනමක් හදාගෙන ඒ වාගේම ඒ ගැන යම්කිසි දැනුම් හයියක් හදාගෙන තමයි මෙතැනට එක්කාසු උනේ. ඒ ඇවිල්ල දැන් අපි සුවිසි ප්‍රත්‍යය ධර්ම කාරණා ටික වෙන වෙනම කථා කරලා ඒවගේ තිබෙන බෙදුම් ටික කථා කරලා දැන් මේ කාලේ අපි කථා කරන්නේ ඒකෙ වීථි සංග්‍රය. එහෙම නැත්නම් වීථි ක්‍රමය. මේවා චිත්ත වීථි නොවෙයි. අභිධර්මයේ පට්ඨානය විස්තර කරන වීථි සංග්‍රය තමයි මේ කියාගෙන යන්නේ. පසුගිය කාලේ උපනිශ්‍රය ප්‍රත්‍යය දක්වාම ඒකෙ විභංග කථා විස්තරය අපි කිව්වා. පට්ඨාන විස්තරයේ තිබෙනවා **පඤ්හාවාර විභඞ්ගය** කියලා ප්‍රශ්න අසලා බෙදලා විස්තර කරන්නා වූ පාලි පෙළක්. ඒක තමයි අපි මේ කාලේ කරන්නේ. ඒකෙ **'කුසල' 'අකුසල' 'අව්‍යාකෘත'** වශයෙන් ධර්ම කාණ්ඩ කොටස් වලට බෙදලා ඊට පස්සේ ඒවා කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියන එක දැන් මේ කියාගෙන යන්නේ.

මේ පට්ඨාන ප්‍රත්‍යය ධර්ම පළබඳව වීථි සංග්‍රය කරගෙන යනකොට මේ පින්වතුන්ට මතක ඇති හැම වෙලාවේම මේ ධර්ම ටික ගොඩවල් තුනකට එහෙම නැත්නම් ස්කන්ධ කථනය කරලා ඉදිරිපත් කරලා තිබෙනවා. අද මේ පින්වතුන්ට මම මේ ඉදිරිපත් වෙච්ච කාලය තුල කියන්න බලාපොරොත්තු වෙන්නේ **පුරෙජාත ප්‍රත්‍යය ධර්මය** බෙදා තිබෙන ක්‍රමය.

අපිට වචන තුනක් හැම වේලාවේම මේ කථනයේදී කනට ඇහෙනවා. මේ වචන තුන කනට ඇහෙන කොට තමන්ගේ හිත දක්ෂ වෙන්න ඕනෑ මේ වචනයෙන් කියන්නේ මෙන්න මේ හරියයි, මේ වචනයෙන් කියන්න මෙන්න මේ ධර්ම ගොනුවයි, මේ වචනයෙන් අර්ථ ගන්වන්නේ මෙන්න මේ ධර්ම පරාසයයි කියන එක හිතට හැඟෙන්න ඕනෑ. හිතට වැටෙන්න ඕනෑ. හිතට දැනෙන ඕනෑ. ආන්න එහෙම වෙනකොට තමයි හරියට හිත සමාධි ගතව හොඳට හැසිරෙන්නේ. තේරුම් යන්නෙත් එතකොටයි.

ඒ ධර්ම වචන තුන තමයි **'කුසල ධම්ම' 'අකුසල ධම්ම' 'අව්‍යාකෘත ධම්ම'**. නැවත පොඩ්ඩක් ආපස්සට ගිහිල්ලා බැලුවොත් ඇත්තම අපි මොනවාද කළේ කියලා, ඉස්සරවෙලාම අපි දැනගත්තා **'චිත්ත' 'චෛතසික' 'රූප' 'නිබ්බාන'** කියලා ධර්ම සමුදායක්. **චිත්ත ධර්ම 89** අපි දැන ගත්තා. ඒවගේම ඒවා ගැලපිලා යන ඒ චිත්ත ධර්ම ඇතුලත චිත්ත ගති චිත්ත ස්වරූප හැටියට ක්‍රියාත්මක වෙන **චෛතසික ධර්ම 52** කුත් අපි දැන ගත්තා. මේවා සියල්ල නාම ධර්ම. ඒවාගේම අපි දැන ගත්තා මූලික වශයෙන් රූප 4 කුත් උපාදාය රූප ස්වභාව 24 කුත් වශයෙන් ඔක්කොම **රූප 28** දැන ගත්තා ලක්ෂණ රූපත් එක්ක. මේ 89 වූ සිත් සමූහයත් 52 වූ චෛතසික ධර්මයනුත් 28 හැටියට කියලා දෙන රූප සමූහයත් අරගෙන අපි නාම රූප ධර්ම හැටියටත් කුසල අකුසල අව්‍යාකෘත හැටියටත් පෙළ ගස්සාගෙන බෙදාගෙන මේවා චිත්ත වීථියක වැඩ කරන අකාරය කථා කරගෙන ආවා. මෙතැනදී කුසල කියලා කියනකොට අපේ හිතට හැඟෙන්න ඕනෑ හිතට පින්තූර ගතවෙන්න ඕනෑ කුසල කියන වචනයෙන් කියවෙන ධර්ම සමූහයක් තිබෙනවා. ඒ තමයි

- කාමාවචර කුසල් සිත් 8
- රූපාවචර ධ්‍යාන කුසල් 5
- අරූපාවචර ධ්‍යාන කුසල් 4
- අපරියාපන්න මාර්ග සිත් 4

කුසල ධර්ම කියලා කියන කොට මෙන්න මේ ටික හොඳට හිතට වදින්න ඕනෑ. (<u>නමුත් මාර්ග සිත් 4 හේතු ඵල ධර්ම කථාවේදී හැම තැනම බාර ගැනෙන්නේ නෑ</u>). නමුත් කුසල් සිත් 21 තිබෙන බව අපි දැන ගන්න ඕනෑ. කුසලා ධම්මා කියලා කියනකොට මෙන්න මේ හරියේ අපේ හිත ගැවසෙන්න ඕනෑ. මෙන්න මේ ටික ගැන තමයි කියන්නේ කියලා දැනගන්න ඕනෑ. අනිත් එක තමයි මේ කුසල ධර්ම 21 ගැන කියන කොට මේවා තනියෙන් හුදකලාව චිත්ත ධර්ම හැටියටම එන්නේ නෑ. මේ සිත් ඇතුලේ තිබෙනවා ඒවාට ආවේනික වෙච්ච ඒවාට අදාළව වැඩ කරන්න හේතු භූත වෙන උපකාර වෙන ගුණ භාවයෙන් යුක්ත වෙච්ච චෛතසික ධර්ම තිබෙනවා. ඒවත් මේවාට අන්තර්ගත වෙනවා. කුසලා ධම්මා කියනකොට කුසල් සිත් 21 සහ ඒවා තුල තැවරී ගැලපී ක්‍රියාත්මක වෙන්නාවූ චෛතසික 38 පමණ තිබෙනවා. ඒවා තමයි අපි ගන්නේ **කුසලා ධම්මා** කියන කොට. මේ කිව්වේ පොදු වශයෙන්. මම මේ කිව්වේ මේ වැඩේට බහිනකොට අපි දැනගෙන තිබිය යුතු දේ. මේ සිත් 89 තිබුණාට ඒ ඔක්කොම කුසල නොවෙයි. මෙයින් කුසල ධර්ම හැටියට කථා කරන සිත් තිබෙන්නේ **21**යි සහ චෛතසික ධර්ම **38යි**.

අනිත් එක තමයි අකුසල ධර්ම. අකුසල් **සිත් 12** තිබෙනවා. ඒ සිත් වල වැඩ කරන චෛතසික ධර්ම තිබෙනවා 27ක්. මේ අකුසල් සිත් 12 **චෛතසික 27 'අකුසලා ධම්මා'** කියලා කියනකොට හොඳට මැවෙන්න පෙනෙන්න පින්තූර ගතවෙන්න ඕනෑ.

මේ කුසල සිත් 21 සහ චෛතසික38 + අකුසල සිත් 12 සහ චෛතසික 27 අයින් උනහම අපිට තව වචනයක් එනවා **අබ්‍යාකතා ධම්මා** කියලා. අබ්‍යාකතා ධම්මා කියන වචනයෙන් හඟවන එයින් කියා දෙන ධර්ම ස්වභාව තිබෙනවා කීපයක්.

- විපාක - (කුසල හෝ අකුසල) මොකක් හරි විපාකයක් එනවා නම් ඒ විපාක සිත් වලට සහ විපාක සිත් වල වැඩ කරන චෛතසික වලට කියනවා අව්‍යාකෘත ධර්ම කියලා.

- ක්‍රියා සිත් සහ ඒවායේ වැඩ කරන චෛතසික වලටත් කියනවා අව්‍යාකෘත ධර්ම කියලා.

- රූප ධර්මයොත් සියල්ල අව්‍යාකෘතයි. ඒවා කුසල් වෙන්නෙත් නෑ අකුසල් වෙන්නෙත් නෑ.

- නිර්වාණයත් අව්‍යාකෘතයි.

**එතකොට 'විපාක' 'ක්‍රියා' 'රූප' සහ 'නිර්වාණය'** යන ධර්ම **අව්‍යාකෘතයි.** මේ අව්‍යාකෘත ධර්ම වල තිබෙනවා ගොඩවල් හතරක්. නමුත් මේ විභංග වාරය කථා කිරීමේදී නිර්වාණ ධාතුව මේකට ඉදිරිපත් කරගන්නේ නෑ. නාම ධර්ම ටික ක්‍රියාත්මක වෙන, වැඩ කරන පරාසය නැත්නම් ඒ චිත්ත වීථිවල වැඩ කරන ටික තමයි ගන්නේ.

අද **පුරේජාත ප්‍රත්‍යය** පිළිබඳව කියනකොට ඒ **පුරේජාත ප්‍රත්‍යය** විස්තර කරපු ධර්ම කාණ්ඩයක් තිබෙනවා. අන්න ඒ කාණ්ඩය පිළිබඳව පොඩ්ඩක් දැනුවත් වෙමු. මෙහෙමයි ඒ විභංගය ඉදිරපත් කරලා තිබෙන්නේ....

1) <u>වෙනි වීථිය</u>

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස පුරෙජාතපච්චයෙන පච්චයො – ආරම්මණපුරෙජාතං, වත්ථුපුරෙජාතං**

**අබ්‍යාකතො ධම්මො** = අව්‍යාකෘතවූ ධර්මයක්
**අබ්‍යාකතස්ස ධම්මස්ස** = අව්‍යාකෘත ධර්මයකට
**පුරෙජාතපච්චයෙන පච්චයො** = පෙර උපන්නා වූ ප්‍රත්‍යය ගුණයෙන් ප්‍රත්‍යය වෙනවා.

මේක ආකාර දෙකක් වෙනවා. **ආරම්මණපුරෙජාත** සහ **වත්ථුපුරෙජාත** වෙනවා. මේ අහගෙන ඉන්න පින්වතුන් හොඳට තේරුම් ගැනීම වටිනවා. මේ පුරෙජාත කියන කථාව අපි ඉස්සෙල්ලා අහලා තිබෙනවා ප්‍රත්‍යය විග්‍රහයේදී. පුරෙජාත කියලා කියන්නේ කලින් හටගත්ත දේ. පළමුවෙන් ඉපදිච්ච ධර්මය **පුරෙජාතයි** කියලා කියනවා. එතකොට කලින් ඉපදිච්චදේ කුමක් හෝ තවත් ධර්මයකට යම්කිසි පිහිටක් ප්‍රත්‍යයක් වෙනවා. ඒ කියන්නේ ඉස්සෙල්ලා ඉපදිලා පස්සේ ඉපදෙන ධර්මයකට පිහිටක් ප්‍රත්‍යයක් වෙනවා, උපකාරක ස්වභාවයක් ඇති කරනවා. එහෙම ගුණයක් තිබෙනවා.

ඒ කියන්නේ කලින් ඉපදිලා පස්සේ ඉපදෙන දේකට උපකාර වෙන්න පුළුවන් උපකාර විය හැකි ගුණ තිබෙන ධර්මතා දෙකක් තිබෙනවා. එකක් තමයි **ආරම්මණය.** අනිත් එක තමයි **වස්තුව. ආරම්මණපුරෙජාත** වෙනවා. **වත්ථුපුරෙජාත** වෙනවා. මේ දෙකම **පුරෙජාත** වෙනවා.

දැන් මොකක්ද ආරම්මණය කියලා කියන්නේ? මොකද්ද වස්තුව කියලා කියන්නේ? අපි මේකට සුපුරුදු භාවිතයට යන්න ඕනෑ. අපි හැමවෙලේම ගන්නේ ඇහැ. අපි රූපයක් දකිනවා කියන එක තමයි අපි නිතරම ලේසියෙන්ම ගන්න තිබෙන දේ.

දැන් ඇස ගත්තහම ආරම්මණය මොකක්ද? ආරම්මණය තමයි වර්ණ රූපය.
වස්තුව මොකක්ද? වස්තුව තමයි චක්ඛු ප්‍රසාදය.

- සද්දයක් ගත්තහම ආරම්මණය වෙන්නේ සද්දය.
- වස්තුව වෙන්නේ සෝත ප්‍රසාදය.
- නාසය ගත්තහම ගඳ සුවඳ තමයි ආරම්මණය වෙන්නේ.
- ඝාණ ප්‍රසාදය තමයි වස්තුව වෙන්නේ.
- දිව ගත්තහම රසය තමයි ආරම්මණය වෙන්නේ.
- ජිව්හා ප්‍රසාදය තමයි වස්තුව වෙන්නේ.
- කය ගත්තහම ස්පර්ශය වෙන්නා වූ දේ තමයි ආරම්මණය වෙන්නේ.
- කාය ප්‍රසාදය තමයි වස්තුව බවට පත්වෙන්නේ.

ඔය විදියටයි තිබෙන්නේ. **ආරම්මණපුරෙජාත වත්ථුපුරෙජාත** කියන කථාවේ කියන්නේ ආරම්මණයත් කලින් ඉපදිලා වස්තුව කියන එකත් කලින් ඉපදිලා පස්සේ පහළ වෙන මොකක් හරි දේකට උදව්වක් උපකාරයක් වෙනවා කියන එකයි මේ කියන්නේ.

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස පුරෙජාතපච්චයෙන පච්චයො – ආරම්මණපුරෙජාතං, වත්ථුපුරෙජාතං** යන පාලි වාක්‍යයෙන් විස්තර කරලා දෙනවා මේක අව්‍යාකෘත ධර්මයක් කියලා.

වස්තුවත් රූපයක්, ඒක නිසා ඒක අව්‍යාකෘතයක්. ඒවගේම ආරම්මණයත් රූපයක්. ඒකත් අව්‍යාකෘතයක්. හොඳට පැහැදිලිව තේරුම් ගන්න අපේ පින්වතුන් **අබ්‍යාකතො ධම්මො** කියනකොට මේ රූප ධර්ම, **අබ්‍යාකතස්ස ධම්මස්ස** කියන කොට තවත් අව්‍යාකෘත ධර්මයකට පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

අපි බලමු තව ටිකක් ඉස්සරහට ගිහිල්ලා. **ආරම්මණ පුරෙජාතය** මෙහෙම කියනවා. **අරහා චක්ඛුං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති** = රහතන්වහන්සේ ඇස, ඒ කියන්නේ වස්තුවක් අනිත්‍ය වශයෙන් දුක්ඛ වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් දකිනවා, නුවණින් බලනවා මෙනෙහි කරනවා. විපස්සනා කරනවා. ඒවගේම සෝත, ඝාණ, ජිව්හා, කාය යන වස්තු පහම දුක්ඛ වශයෙන් අනිත්‍ය වශයෙන් අනාත්ම වශයෙන් බලනවා. ඒවගේම රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන ඒ ආරම්මණ ටිකත් දුක්ඛ වශයෙන් අනිත්‍ය අශයෙන් අනාත්ම වශයෙන් විපස්සනා කරනවා. මේ විදියට විපස්සනා කරන්නේ රහතන් වහන්සේ. රහතන්වහන්සේ මෙලෙස විපස්සනා කරනකොට ඒ විපස්සනා කරන්නේ ඇත්තටම මොන හිතකින්ද? කුසල් සිතකින්ද? නෑ, කුසල් සිතකින් නොවෙයි. විපස්සනා කරනකොට රහතන් වහන්සේගේ හිතේ පහළ වෙන්නේ ක්‍රියා සිතක්. ඒ ක්‍රියා සිත අව්‍යාකෘතයි. ඒ අව්‍යාකෘත වූ ක්‍රියා සිත පහළ වෙන්න ඒවගේම ඒ ක්‍රියා සිතට ක්‍රියාත්මක වෙන්න, නුවණින් බලන්න, නුවණින් මෙනෙහි කරන්න පහළ වෙන ඒ ආරම්මණ ගුණයෙන් යුක්තවූ 'වර්ණ' 'ශබ්ද' 'ගන්ධ' 'රස' සහ 'ස්පර්ශයනුත්' 'වස්තුත්' උපකාර වෙනවා.

මෙන්න මේ වගේ කථාවක් තිබෙනවා. ඒකත් අපි දැනගෙන ඉන්න ඕනෑ. ඒක මෙතැනට ගැලපෙනවා. දැන් මෙතැනදී කියනවා පුරෙජාත කියලා කථාවක්. ඒ කියන්නේ කලින් ඉපදිලා තිබෙන්න ඕනෑ. මෙතැන 'කලින් උපදිනවා' නැත්නම් 'පෙර' කියලා කියන්නේ පැයකට කලින් වෙන්න පුළුවන් පැය භාගයකට කලින් වෙන්න පුළුවන් පැය කාලකට පෙර වෙන්න පුළුවන්, විනාඩි දහයකට කලින් වෙන්න පුළුවන්, විනාඩියකට කලින් වෙන්නත් පුළුවන්. නැත්නම් විනාඩි භාගයකට කලින් හෝ තත්පරයකට කලින් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් චිත්තක්‍ෂණ දහයකට කලින් හෝ චිත්තක්‍ෂණ පහකට කලින් හෝ එක චිත්තක්ෂණයකට කලින් හෝ පහළ වෙනවා නම් යමක් ඒකට කියනවා **'පුරෙජාත'** නැත්නම් **'කලින් උපන්'** කියලා.

මෙතැන හරි සියුම් ස්වභාවයක් තිබෙන්නේ. හරි සියුම් ගුණයක් මෙතැන විස්තර කරලා දෙන්නේ. රූප පහළ වෙනකොටයි ඒ රූපයට හිත සම්බන්ධ වෙලා විමසා බලන අවස්ථාවයි කියලා කියන්නේ එකම වේලාවක වෙන එකක් නොවෙයි. ඒක වෙන්නේ මෙහෙමයි. අපි මීට කලින් ඉගෙන ගත්තා යම් කිසි ආරම්මණයක් දැන ගැනීමට ගැලපී යන සිත් පෙළක් ක්‍රමානුකූලව විහිදී යන්න ඕනෑ කියලා. ආරම්මණයට බැසගෙන ආරම්මණයට හැරිලා ආරම්මණයට යොමුවෙලා ක්‍රියාත්මක වෙන යම්කිසි ක්‍රමානුකූල අවුල් නැති වියවුල් නැති යම් කිසි නාම ධර්ම පේළියක් යම් කිසි ක්‍රමයකට ඇදෙන්න ඕනෑ. ඒකෙන් තමයි මේ ආරම්මණය අල්ලාගෙන දැනගෙන ඉස්සරහට යන්නේ. අපි සාමාන්‍යයෙන් සිතෙන් ආරම්මණයකට යන්නේ භාවංගය මුල් කරගෙනයි. භවාංග චලනය වෙලා භාවංගය බිඳී සිඳී ගිහිල්ලා ඊට පස්සේ පංච ද්වාරාවජ්ජන සිත පහළ වෙලා චක්ඛුවිඤ්ඤාණ සිත පහළ වෙලා ඊළඟට සම්පටිච්ඡන සිත ඊළඟට සන්තීරණ සිත පහළ වෙලා තීරණාත්මක ගුණයෙන් යුක්ත වෙච්ච වොත්ථපන සිතකුත් පහළ වෙලා ඊට පස්සේ ජවන් ගතවෙලා තදාරම්මණ වෙලා නැවතත් භවාංග ගතවෙනවා.

අපි දැනගෙන තිබෙනවා නාමයේ හෙවත් සිතක ආයුෂ කාලයයි රූපයක ආයුෂ කාලයයි එකසමාන වෙන්නේ නෑ කියලා. මේ අභිධර්ම විස්තරයට අනුව අභිධර්මය පිළිබඳව ගාම්භීරව විස්තර කරන කොට අපිව දැනුවත් කරලා තිබෙන්නේ රූපයක ආයුෂයයි නාමයක ආයුෂයයි එක සමාන වෙන්නේ නෑ කියලා. යම් කිසි රූපයක් ඉපදුනහම ඒ රූපයට හිත පවතින කාල 17 ක් පවතින්න පුළුවන්. ඒක නිසා තමයි රූපය චිත්තක්ෂණ 17 කට ආයුෂය තිබෙන්නා වූ ධර්ම ස්වභාවයක් කියලා හඳුනාගෙන තිබෙන්නේ. ( රූපයක ආයුෂ = චිත්තක්‍ෂණ 17 ) ඒක තර්කානුකූලව නොවෙයි විශේෂ ගැඹුරු නුවණකින් දැක දැන අවබෝධ කරගෙන දේශනා කරලා තිබෙන මහා ගාම්භීර ධර්ම කාරණාවක්. ඒක උඩින් පල්ලෙන් තමන්ගේ දෘෂ්ඨිගත වෙච්ච හිතකින් මොකක්වත් දන්නේ නැතුව හිතෙන හිතෙන දේවල් කියලා එහෙට මෙහෙට කරන්න පුළුවන් කමක් නෑ. ඒක විශේෂිත ඥාන ශක්තීන්ගෙන් ඥාන ධර්මයන්ගෙන් යුක්ත වෙච්ච ඒ වගේම ආර්ය ගුණ වලින් ආර්ය හිත් වලින් පිරිච්ච උත්තමයන් දේශනා කරලා තිබෙන්නාවූ ධර්ම විස්තර.

එතකොට මේ සිත වගේ වාර 17 ක් ඉන්න පුළුවන් රූපයට. භවංගයේ සිත තිබෙනකොට ඒ කියන්නේ රූපයක් පහළ වෙනකොටම ඒ රූපය පැත්තට භවාංගයෙන් සිත බිඳිලා එනවා. එක වෙලාවටම භවාංගයෙන් බෑ රූපය දකින්න.

1) භාවංගය තිබුණා
2) ඒක චලනය උනා
3) ඊළඟට භවාංග උපච්ඡේද උනා - දැන් මේ විදියට සිත් තුනක් යනකම් රූපය පහළ වෙලා තිබෙනවා.

4) ඊට පස්සේ පංචද්වාරා වජ්ජනය පහළ උනා. එතකොට සිත් 4යි. තවමත් රූපය පවතිනවා, මැරිලා නෑ. නමුත් සිත් පෙළේ නම් භාවංගය හැදුනා - භවාංගය සෙලවුනා - භවාංගය කැඩිලා ගියා - පංචද්වාරා වජ්ජනය පහළ උනා - ඒකත් නැති වෙලා ගියා. පංචද්වාරා වජ්ජනය පහළ උනාට පස්සේ පහළ වෙනවා හිතක් ඒක තමයි වර්ණය ග්‍රහණය කර ගන්න 5) චක්ඛු විඤ්ඤාණ සිත. ඔන්න එතකොට චක්ඛු විඤ්ඤාණය තමයි ඒ සිත් පේළියේ පස් වෙනි සිත. එතකොට මේ චක්ඛු විඤ්ඤාණය කියන සිතෙන් දකින්නේ චක්ඛු විඤ්ඤාණයත් එක්කම පහළ වෙච්ච රූපයක් නොවෙයි. චක්ඛු විඤ්ඤාණයෙන් දැන ගන්නේ චක්ඛු විඤ්ඤාණය පහළ වෙන්න චිත්තක්ෂණ හතරකට කලින් පහළ වෙලා තිබෙන්නා වූ රූපයක්. ඒක නිසා කියනවා චක්ඛු විඤ්ඤාණයෙන් දැන ගන්නා වූ ආරම්මණය **'ආරම්මණ පුරෙජාතයි'** කියලා කියනවා. ඊට පස්සේ සම්පටිච්ඡනයට යනකොට තවත් වෙනස් වෙලා යනවා.

මේ වගේම තමයි සෝත විඤ්ඤාණය. සද්දය හටගන්නේ භවාංගයත් එක්ක. ඒ සද්දය එනකොටම ඒ භවාංගය බිඳිලා භවාංග චලනය වෙලා භවාංග උපච්ඡේද වෙලා ඊට පස්සේ පංචද්වාරාවජ්ජන යන සිත් ගිහිල්ලා තමයි, ඒ කියන්නේ සද්දය හටගෙන චිත්තකෂණ කීපයක් ගියාට පස්සේ තමයි ඒක දැනගන්නේ. ඒක නිසා 'චක්ඛු විඤ්ඤාණයට' 'සෝත විඤ්ඤාණයට' 'ඝාණ විඤ්ඤාණයට' 'ජිව්හා විඤ්ඤාණයට' 'කාය විඤ්ඤාණයට' ඇතිවෙන අරමුණු හැටියට ඉදිරිපත්වෙන වර්ණයක් හෝ සද්දයක් හෝ ගන්ධයක් හෝ රසයක් හෝ ස්පර්ශයක් හෝ යන මේ ආරම්මණ ඩිංගක් හෝ පරණ වෙලා තමයි එන්නේ. ගොඩක් නොවෙයි, චිත්තක්ෂණ කීපයක් පමණයි. ඒක නිසා එතැනින් අරගෙන කියනවා **පුරෙජාතපච්චයෙන පච්චයො** කියලා. එතකොට ඒ **ආරම්මණපුරෙජාත භාවයයි.**

**වත්ථුපුරෙජාත භාවය** කියනකොට මෙහෙම තිබෙනවා. ඔය ඇස කියන එකෙත් රූප ඇති වෙලා නැති වෙලා යනවා. ඒවා පහළ වෙනකොටත් චක්ඛු විඤ්ඤාණය හරියට එනකොට ඊට කලින් පහළ වෙලා තිබ්ච්ච පුංචි **ප්‍රසාදනීය චක්ඛු රූපයක්** මත පිහිටලා තමයි **චක්ඛු** විඤ්ඤාණය ආරම්මණය දැන ගන්නේ. ඔන්න ඔය නිසා තමයි **චක්ඛු වස්තුව පුරෙජාත** කියලා කියන්නේ.

දැන් එතකොට රහතන්වහන්සේ නමක් මෙනෙහි කරනකොට උන්වහන්සේගේ 'ක්‍රියා සිත්' = 'අව්‍යාකෘතයි' 'රූප' = 'අව්‍යාකෘතයි' ඒක නිසා කියනවා අව්‍යාකෘත ධර්මවන රූප පෙර පහළ වෙලා පසුව පහළ වන්නාවූ නාම ධර්මයන්ට ආරම්මණ වශයෙන් සහ පුරෙජාත වස්තු වශයෙන් ප්‍රත්‍යය වෙනවා කියලා.

තව එකක් දැන ගන්න ඕනෑ. අපි මතක තියා ගන්න ඕනෑ. මේකේ තිබෙනවා ප්‍රත්‍යය වන ධර්ම සහ ප්‍රත්‍යය නිසා හටගන්න ධර්ම. **ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උප්පන්නය**. ප්‍රත්‍යය උප්පන්න

ධර්මය කියලා කියන්නේ  යම් කිසි ප්‍රත්‍යය ගුණයක් නිසා උපකාරක ධර්මයක් නිසා මතුවෙන ධර්ම කොට්ඨාසය **ප්‍රත්‍යය උප්පන්නයි** = ප්‍රත්‍යය නිසා උපන්න  දේ. මෙතැනදී චක්ඛු විඤ්ඤාණය සහ චක්ඛු විඤ්ඤාණය ඇතුලේ තිබෙන චෛතසික ටික ප්‍රත්‍යය උප්පන්නයි.  ඒ චක්ඛු විඤ්ඤාණය පහළ වෙන්න ඉදිරිපත් වූ වස්තුව සහ ආරම්මණය යන දෙකම වස්තු වශයෙන් සහ ආරම්මණ වශයෙන් පුරෙජාත වෙනවා. මේ විදියට අපි මේකේ තිබෙන්නා වූ ගුණ ස්වභාවය දැනගන්න ඕනෑ.

දැන් රහතන්වහන්සේ නමක් ඔය ටික මෙනෙහි කරනකොට උන්වහන්සේගේ සිතේ පහළ වෙන අව්‍යාකෘත ක්‍රියා සිත් ටික ඔක්කොම පහළ වෙන්නේ  ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැටියට = **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස පුරෙජාතපච්චයෙන පච්චයො.**

තව එකක් තිබෙනවා. ඒ තමයි **මනෝධාතු** ස්වභාවය. පංචද්වරාවජ්ජන සිත මනොද්වරාවජ්ජනය යන සිතුත් ක්‍රියා වශයෙන් තිබෙන්නා වූ ධර්ම නිසා ඒවත් කථා කරන්නේ අව්‍යාකෘත ධර්ම ස්වභාවය හැටියට. කවදාකවත් පංචද්වරාවජ්ජන සිත කුසල සිතක් නොවෙයි. ඒක අකුසල සිතකුත් නොවෙයි. ඒක අව්‍යාකෘත ගුණයෙන් යුක්ත වෙච්ච සිතක්. අපිට  නොපෙනුනාට අපිට නොදැනුනාට අපේ ඇහැ තුල අපිට අරමුණු වන්නා වූ ආරම්මණය  තුල  තිබෙනවා,  අපේ ඇතුලේ පහළ වෙන්නා වූ සිත්වලට අමුතු ගුණ බලපෑමක් කරන  සහ ඒවා පහළ වෙන්න හරියට විස්තර  කරගන්නත් බැරි තරමේ සියුම් වෙච්ච උපකාරක ධර්ම ගුණයක්  උපකාරක ශක්ති ගුණයක් තිබෙනවා.  ඒක නිසා තමයි ඒවා පහළ වෙන්නේ. රහතන් වහන්සේ නමක් අනිත්‍ය වශයෙන් දුක්ඛ වශයෙන් අනාත්ම වශයෙන් මෙනෙහි කරගෙන මෙනෙහි  කරගෙන යනකොට උන්වහන්සේගේ  ඒ ක්‍රියා සිතේ සරු වේගවත් වූ පිරිසිදු  ඥානයක් තිබෙනවා. ඒ ඥානයෙන්  යුක්ත වෙච්ච හිතකින් චෛතසික ධර්ම සමුදායකින් තමයි ඕක බලන්නේ.  ඒවා  බලන්න  මෙනෙහි කරන්න උන්වහන්සේලා ආධාර උපකාර කරගන්නේ ඒ ඒ තැන පහළ වෙන ආරම්මණයන් නොවෙයි ඊට  ටිකකට කලින් පහළ වෙච්ච ආරම්මණයන්.  එනම්  රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ  ඒවගේම  චක්ඛු  සෝත ඝාණ ජිව්හා කාය යන මේවා තමයි ආධාර උපකාර කරගන්නේ. ඒක නිසා එතැනදී  කියනවා  බලන හිතත් අව්‍යාකෘතයි. බලන හිතට උපකාර වන ප්‍රත්‍යය ගුණය බිහි කරන ඒ ධර්මත් අව්‍යාකෘතයි කියලා.

තව ලස්සන කථාවක්  තිබෙනවා මෙහෙම. මේ පට්ඨානයේ තිබෙනවා **දිබ්බෙන චක්ඛුනා රූපං පස්සති කියලා.**  ඒකෙ දිගටම තිබෙනවා  **දිබ්බෙන චක්ඛුනා රූපං පස්සති, දිබ්බාය සොතධාතුයා සද්දං සුණාති. රූපායතනං චක්ඛුවිඤ්ඤාණස්ස පුරෙජාතපච්චයෙන පච්චයො** කියලා. කෙලෙස් නැති රහත් ගුණයෙන් පිරි රහතන් වහන්සේ නමක්  ක්‍රියාත්මක කරගන්නවා උන්වහන්සේගේ බලවත් වූ දිවැසක්. ඒක අභිඤ්ඤා ගුණයක්. සිතට සම්බන්ධ වූ ඇස් ගතියක්. දිබ්බ චක්ඛු  කියලා කියන්නේ ඒකයි. ඒ සිතට  සම්බන්ධ ඇහැ කියන

ගතියෙන් උන්වහසේට දුර තිබෙන ඕනෑම දෙයක් හොඳට දකින්න පුළුවන්. සූක්ෂම දෙයක් ඕලාරික දෙයක් ඕනෑම දෙයක් උන්වහන්සේට දකින්න පුළුවන්.

අපි මෙහෙම හිතමු. රහතන්වහන්සේ නමක් හොඳට දිවැස් උපදවාගෙන ( උන්වහන්සේ ඒ වැඩේ කරන්නේ ඇස් දෙකෙන් නොවෙයි) උන්වහන්සේගේ සිතේ තිබෙන නිකලෙස් ඥාන ගුණයෙන් ඇසෙන් වගේම දකින්න පුළුවන්. දැන් අපි මෙතෙක් කල් කථා කළේ කර්මයෙන් උපන් ඇස පිළිබඳවයි. නමුත් මේක එහෙම නොවෙයි. උන්වහන්සේගේ ඥානයේ තිබෙනවා ඇස වගේම පෙන්නුම් කරන ගතියක්. ඒකට කියනවා අභිඤ්ඤා සිත් කියලා. මේ දිවැසින් බලනකොට ඒකට ළඟ දුර වශයෙන් ප්‍රශ්නයක් නෑ. ඒක සියුම් උනත් ඕලාරික උනත් ළඟ තිබුනත් වැහිලා තිබුනත් හොඳට දකිනවා. අපි හිතමු හැතැක්ම 5ක් 6 ක් එහා පැත්තේ මහා විසාල කඳු යායකට එහා පැත්තේ කවුරුහරි කෙනෙක් මලක් කඩනවා. රහතන් වහන්සේ දුර ඉඳලා බලනවා. උන්වහන්සේ ඒ බලන්නේ කඳු යායක් විනිවිදගෙන. ඒ කඳුයාය විනිවිදගෙන බලනකොට උන්වහන්සේට සිතේ පහළ වෙන්නේ අභිඤ්ඤා සිත් පෙළක්. ඒ අභිඤ්ඤා ඥානයන්ට සිත් පේළියට ආරම්මණ වශයෙන් ගොදුරු වෙන්නේ කඳු වළල්ලකින් එහා පැත්තේ මල් කඩන්නා වූ කෙනාගේ මල. ඒවගේම ඒ කෙනාගේ දර්ශනය. රහතන්වහන්සේගේ අභිඤ්ඤා සිතට ඒ කෙනාගේ වර්ණයත් ග්‍රහණය වෙනවා. ඒවගේම එයාගේ හැඩයත් ග්‍රහණය වෙනවා. මලත් ග්‍රහණය වෙනවා. එතකොට ඒ ග්‍රහණය වෙන්නාවූ මල පුද්ගලයාගේ පාට ඒ වෙලාවේ පහළ වෙච්ච දේ. ඒ වෙලාවේ පහළ වෙච්ච දේ උනාට චිත්තක්ෂණ කීපයකින් එහාට මෙහාට වෙච්ච දෙයක් තමයි උන්වහසේගේ ඥානයෙන් දකින්නේ. හැබැයි ඒකෙන් උන්වහන්සේට අඩුවක් පාඩුවක් වෙන්නේ නෑ. ආන්න ඒ වගේ **පුරෙජාත ස්වභාවය** තිබෙන්නේ **ආරම්මණයේ**. ඒවගේම **ප්‍රත්‍යය උප්පන්න** ධර්ම ස්වභාවය තිබෙන්නේ උන්වහන්සේගේ අභිඤ්ඤා සිතේ. ඒ අභිඤ්ඤා සිත තමයි පහළ වෙන්නේ අර ටික අරමුණු කරගෙන.

ඉතින් අපි මේ කාරණා මෙහෙම කියාගෙන යනකොට කෙනෙකුට හිතෙන්න පුළුවන් සංසාර දුකට පත්වෙලා සසර දුකේ ගැලිලා ඉන්න අපිට සංසාර දුකෙන් මිදෙන්න තිබෙන විපස්සනා කථාවක් කරන්නේ නැතුව මේ රහතන් වහන්සේ අභිඤ්ඤා සිතයි ආරම්මණයයි ගැන කීමෙන් ඇසීමෙන් අපේ නිවන් ගමන යනඑක නැත්නම් ධර්ම අවබෝධය වෙනවද කියලා. එහෙම කෙනෙක් අහන්නත් පුළුවන්. මේවා නුවණින් අහනකොට අපි දකින්නේ තේරුම් ගන්නේ මේ සංසාරයට අයිතිවෙන ඇති වෙලා නැති වෙලා යන්නා වූ ධර්ම ස්වභාවයක්. අනිත් එක තමයි මේකෙ ගොඩක් වැඩ සිද්ධ වෙනවා. මේ ගැඹුරු ධර්ම කාරණාවන් මෙනෙහි කිරීමේදී අපේ ඉන්ද්‍රිය ධර්මයන් මෝරවනවා. ශ්‍රද්ධාව මෝරවනවා. සතිය මෝරවනවා. වීරිය වැඩෙනවා, මෝරවනවා. සමාධි ගුණය හොඳට කිඳා බැහැලා මෝරවනවා. ඥානය ප්‍රඥාව මෝරවනවා. සප්ත බෝධි අංග ධර්ම වැඩෙනවා මෝරවනවා. සම්මා දිට්ඨිය මුල කරගත් සම්මා සංකප්පය ආදී ආර්ය අෂ්ඨාංගික ධර්මයන් වැඩෙනවා,

මෙරීම් ස්වභාවයට පත්වෙනවා. ඒවාගේම තමයි ඒවා අභ්‍යන්තරික වශයෙන් අපේ හිත තුල වැඩී මෙරීම් ස්වභාවයට පත්වෙනවා වගේම අපිට මේ ධර්ම ස්වභාවයන් ඉදිරිපත් කරලා තිබෙන තථාගතයන් වහන්සේ කෙරෙහි අතිශය ප්‍රේමනීය ගතියක් නමස්කාරමය ගුණයක් අපේ හිතේ පහළ වෙනවා. ඒක බලවත් ශ්‍රද්ධාවක්. මේ ධර්මය රැකගෙන ආපු ගෞරවණීය ස්වාමීන්වහන්සේලා කෙරෙහි අපේ තුල පහළ වෙනවා පුදුමාකාර ශ්‍රද්ධාවක් ගුණයක්. 'මේ වගේ සියුම් ස්වභාවයක් මේ අස්සේ තිබෙනවා නේද' කියලා අපිට ධර්මය කෙරෙහි පැහැදීම් ස්වභාවයක් ඇතිවෙනවා. ඒක නිසා මේ ධර්ම අපිට නිවන් මාර්ගය පාදවලා දෙනවා, මෝරවලා දෙනවා. නිවන් මාර්ගයේ ඉස්සරහට අපිව තල්ලු කරලා දෙනවා.

සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වඩන්නේ නැතිව දියුණු කරන්නේ නැතුව ඒවා හැඩ ගස්ස ගන්නේ නැතුව අපි කොච්චර නිවන් අවබෝධ කරගන්න තැත්කරත් මහන්සි ගත්තත් ඒක වෙන්නේ නෑ. මේ කාලයේ තවත් එකක් තිබෙනවා. දානයක් දෙන්නේ නැතුව සීලයක් සමාදන් වෙන්නේ නැතුව ඒවා කපා හැරලා බෝධිපාක්ෂික ධර්ම වැඩීමක් කරන්නේ නැතුව ඒවත් පැත්තකට දාලා ඒවාගේම තමන්ගේ ආධ්‍යාත්මික ගුණ වගාව නමස්කාර කිරීම් වශයෙන් හෝ ඇති කරගන්නේ නැතුව ඒවත් අහකට දාලා ඒවගේම ධර්ම මේරීම් ස්වභාවයකට පත් කරගන්නේ නැතුව ඵලය ගන්න මහන්සි ගන්න කාලයක් අද. එවැනි පැත්තකට බර වෙච්ච ඒ වගේම චින්තනයෙන් මොට වෙච්ච බොරුවට පැහැදුනා වූ සිත් තිබෙන්නා වූ කෙනෙක් ඔය ප්‍රශ්නය ගොඩ නගන්න පුළුවන්.

හරියට කියනවා නම් පොල් ගහක් හදනවා. පොල් ගහක් හදලා ඒකට වතුර දාන්නෙත් නෑ. ඒවගේම පොහොර දාන්නෙත් නෑ. ඒවගේම වටපිට සුද්ධ කිරීමකුත් නෑ. මොකක්වත් කරන්නේ නැතුව ඒක මෝරලා කොළ අතු දාලා පීදිලා එනකම් බලාගෙන ඉන්නෙත් නැතුව ඉක්මනට ඉක්මනටම හදපු ගමන් මාසෙන් දෙකෙන් තුනෙන් මේකෙන් පොල් ගෙඩි කන්න බලාගෙන ඉන්න වගේ වැඩක්. ඒක නිසා එවැනි අයට මේ වගේ ප්‍රශ්නයක් ඇති වෙන්නත් පුළුවන්. ඒක නිසා ඒකටත් පුංචි හැදින්වීමක් ඔය කළේ.

තවත් එකක් තිබෙනවා.
**දිබ්බාය සොතධාතුයා සද්දං සුණන්ති** = ඒ රහතන් වහන්සේලා දිවැසින් සද්ද අහනවා.

මේක සාමාන්‍යයෙන් තේරුම් ගන්න පුළුවන් මෙහෙම. අපිට ගුවන් යානයක සද්දයක් අහන්න ලැබෙනවා. මේ අනුසාරයෙන් හරි පුරෙජාත ප්‍රත්‍යය තේරුම් ගන්න පුළුවන්. ගුවන් යානයෙන් මේ වෙලාවේ නිකුත් කරපු හඬ නොවෙයි ඇත්ත වශයෙන්ම අපිට අහන්න ලැබෙන්නේ. අපිට ඒ හඬ කනට එනකොට ගුවන් යානය ටිකක් ඈතට ගිහිල්ලා. ඒ පුරෙජාත ස්වභාවය. ඒ පුරෙජාත වූ සද්දය රහතන් වහන්සේගේ අභිඤ්ඤා ක්‍රියා සිතකින් දකිනවා අහනවා. එතකොට ඒ අභිඤ්ඤා සිත පහළ වෙන්න අර ශබ්දය උන් වහන්සේට

ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය ස්වභාවයට පත්වෙනවා. ඔය වගේම තමයි මුලින් කියපු හැටියට රූපය කියන්නා වූ වර්ණය චක්ඛු විඤ්ඤාණයට උපකාර වෙනවා. සද්දය සෝත විඤ්ඤාණයට උපකාර වෙනවා. ගන්ධය ඝාණ විඤ්ඤාණයට උපකාර වෙනවා. රසය ජිව්හා විඤ්ඤාණය පහළ වෙන්න උපකාර වෙනවා. පොට්ඨබ්බය කාය විඤ්ඤාණය පහළ වෙන්න පුරෙජාත ප්‍රත්‍යයයෙන් උපකාර වෙනවා. මෙන්න මේ විදියට ආරම්මණික වශයෙන් පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

අනිත් එක තමයි රහතන්වහන්සේගේ අභිඤ්ඤා සිත පහළ වෙන්නේ ඇස ආධාර කරගෙන නොවෙයි. හෘදය වස්තු රූපය මුල් කරගෙනයි. ඒ වෙලාවට වස්තු වශයෙන් පුරෙජාත වෙන්නේ හෘදය වස්තු රූපයයි. අනිත් වේලාවට ඇසෙන් කනෙන් නාසයෙන් දිවෙන් ශරීරයෙන් අරමුණක් දකිනවා නම් ඒ වේලාවට ගන්නේ ඒ ඒ අදාල වස්තු ස්වභාවයයි.

දැන් මම මෙතෙක් විස්තර කළේ අව්‍යාකෘත ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන ආකාරය. ඊළඟට තව එකක් තිබෙනවා.

2) වෙනි වීථි වාරය

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස පුරෙජාතපච්චයෙන පච්චයො – ආරම්මණපුරෙජාතං, වත්ථුපුරෙජාතං**

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස පුරෙජාතපච්චයෙන පච්චයො** කියලා කියන්නේ අව්‍යාකෘත ධර්ම = ආරම්මණයක් හෝ වේවා නිශ්‍රය වස්තුවක් හෝ වේවා කුසල ධර්මයක් පහළ වෙන්න ආරම්මණ පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

අපි හිතමු මෙහෙම. මොකක් හරි ශබ්දයක් ඇහුනට පස්සේ ඒ සද්දය පහළ උනහම ඒ සද්දය ආරම්මණික වශයෙන් මෙනෙහි කරනකොට එනම් අනිත්‍යය වශයෙන් මෙනෙහි කරන්න හෝ දුක්ඛ වශයෙන් මෙනෙහි කරන්න හෝ අනාත්ම වශයෙන් මෙනෙහි කරන කොට අපිට පහළ වෙන්නේ කුසල් සිත්. ඒ කුසල සිත් වලට ආරම්මණ වශයෙන් හෝ වස්තු වශයෙන් හෝ ඉදිරිපත් උනේ රූප. ඒ රූපයෝ සියල්ල අව්‍යාකෘතයි. ඒවා මෙනෙහි කරන්නා වූ සිත කුසල ධර්මයක් = **අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස පුරෙජාතපච්චයෙන පච්චයො – ආරම්මණපුරෙජාතං, වත්ථුපුරෙජාතං.**

දැන් මම මේ වෙලාව දක්වාම මේ පින්වතුන්ට යම්කිසි ධර්ම හැඟීමක් මතුකළා. ඉතින් මේ අනුසාරයෙන් හිතන්න පුළුවන් අව්‍යාකෘත ධර්මයන් අකුසල ධර්මයකට ප්‍රත්‍යය වෙන ආකාරය. ඒ කියන්නේ මොකක් හරි වස්තුවක් හරි අරමුණක් හරි ඉදිරිපත්

උනහම ඒ රූපමය ගෝචරමය ධර්ම ස්වභාවය අපි හිතින් අල්ලාගෙන ලෝභ කිරීමට යනවා නම් ද්වේශ කිරීමට යනවා නම් එතැනදී ඇතිවෙන්නේ අව්‍යාකෘත වශයෙන් සලකන රූපමය ගුණයක් අකුසල ධර්ම සමූහයක් අප තුල පහළ වෙන්න ඉදිරිපත් වෙනවා කියන එකයි.

ඉතින් මම අද දවසේ මේ පින්වතුන්ට මෙන්න මෙච්චරකින් මේ කථාව හමාර කරනවා. මේ වස්තු පුරෙජාත ස්වභාවය විශේෂයෙන්ම රූප ධර්ම සම්බන්ධයෙන් තමයි තිබෙන්නේ. ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැටියට සඳහන් වෙන්නේ නාම ධර්ම සමුදායක්. අපි මේක මීට අවුරුද්දකට පමණ පෙර කියාපු දෙයක්. අදත් මේ ඇදලා අරගෙන කියන්නේ අපිට නැවත වතාවක් මේ ධර්ම විභංග වාරය සාකච්ඡා කිරීම් වශයෙන් හිතේ උඩට ගන්නයි. ඒ නිසා අපේ පින්වත් සැම දෙනාම බොහොම ශ්‍රද්ධාවෙන් යුක්තව මේ කාරණාටික අහගෙන හිටියා කියලා මම විස්වාස කරනවා.

ඒවගේම අපේ තථාගත බුදුරාජාණන් වහන්සේ සාරිපුත්ත මහරහතන් වහන්සේ කොච්චර සියුම් තැනක ඉඳගෙන ඒ දහම් බැලිල්ල බලලා තිබෙනවාද කියන හැඟීම හරියට ශ්‍රද්ධාවකින් අපිට හැඟෙනවා හිතෙනවා. උන් වහන්සේගේ හිත උන්වහසේගේ ඥානය කොච්චර තැනක ඉඳගෙන කොච්චර සියුම්ව කොච්චර වේගවත්ව කොච්චර පිරිසිදුවට ක්‍රියාත්මක වෙනවද කියන එක අපිට ශ්‍රද්ධාව උපදවාගෙන මෙනෙහි කරන්න පුළුවන්. ඒක නිසා මහා කරුණාවෙන් යුක්තව උග්ඝටිතඤ්ඤූ පුද්ගලයන්ටත් විපඤ්චිතඤ්ඤූ පුද්ගලයන්ටත් ඒවගේම නෙය්‍ය ගුණයෙන් යුක්ත පුද්ගලයන්ටත් ඒවගේම අනාගතයට පිහිටක් සලසා ගන්න පදපරම ගුණ ඇති පුද්ගලයන්ටත් කරුණාවෙන් යුක්තව මේ ධර්ම කාණ්ඩය විස්තර වශයෙන් දේශනා කරලා තිබෙනවා. ධර්ම අවබෝධ කරගන්න අභිධර්ම කථනය හරි වැදගත්. ඒ කියන්නේ පුද්ගල කථනයක් පුද්ගලයන් පිළිබඳ සැලකීමක් පුද්ගලයන් පිළිබඳ විග්‍රයක් නොවෙයි. පුද්ගලයා කියලා ලෝකයේ කථා කරන්නා වූ කෙනා පුංචි පුංචි සියුම් නාම රූප ධර්ම වලට බෙදලා ඒ වගේම චිත්ත වීථි හරහා පුද්ගලයෙක් නැති ආකාරය කියා දෙමින් විස්තර කරන්නා වූ බොහොම ගැඹුරු පිරිසිදු දහම් පාඩමක් මේ. ඒ දහම් පාඩම බොහෝ කාලයක් තිස්සේ අපේ පින්වතුන් සිද්ධ කරගෙන ආවා. එක පැයක කාලයක් සත්වයෙක් නැති පුද්ගලයෙක් නැති ආත්මයක් නැති ධාතු ස්වභාව චිත්ත චෛතසික ධර්ම ස්වභාව පිළිබඳව අපි කථා කළොත් ඒ පැය තුල අපේ හිත ලෝකයේ මුලා වෙලා තිබෙන්නා වූ පුද්ගල ආරම්මණික ගතියෙන් බැහැර වෙලා පුද්ගලයෙක් නැති නාම රූප ධර්ම චිත්ත චෛතසික ධර්ම ඒවාගේම රූප ධර්ම සිත් වශයෙන් ක්‍රියා ඒවාගේම ධර්ම වශයෙන් කුසල අකුසල අව්‍යාකෘත කියන ධර්ම පරාසය මෙනෙහි කරන්න යනකොට ඒ වෙලාවට තදංග වශයෙන් හෝ චේවා ආත්මක් නෑ පුද්ගලයෙක් නෑ කියන පැත්තකට හිත හැරවිලා වැඩ කරනවා. ප්‍රඥාව කියන ධර්මය ශ්‍රද්ධාව ඒකාග්‍රතාවයත් එක්ක මේරීම ස්වභාවයට

පත්වෙනවා. බෝධි පාක්ෂික ධර්ම ගැඹුරින් වර්ධනය වෙනවා. එවැනි අවස්ථාවක් තමයි අදත් මේ පින්වතුන්ට උදා උනේ. අපි ඉතිරි හරිය ඊළඟ සතියේදී කථා කරන්න අධිෂ්ඨාන කරගනිමු. මේ උතුම් ධර්මය මේ විදියට සාකච්ඡා කිරීමෙන් ඇහීමෙන් හිතීමෙන් මෙනෙහි කිරීමෙන් ඒ ධර්මය හිතන්න මෙනෙහි කරන්න අහන්න කුසලච්ඡන්දය උපදවා ගැනීමෙන් උපදවාගත් ඒ ධර්ම සමුදාය අස්සේ තිබෙනවා මහා පුදුම බලයක්. පුදුම ගුණයක්. පුදුම හැකියාවක්. ඒ ධර්ම බලයෙන් සැම දෙනාටම ගාම්භීර වූ නාම රූප ධර්මයන්ගේ වෙනස් වීම ධර්මයන්ගේ තිබෙන්නා වූ වින්දනයක් නැති ගතිය ඒවා තුල තිබෙන්නා වූ හරයක් නැති ස්වභාවය සාරවත් නැති ගතිය තේරුම් අරගෙන සැමදෙනාටම චතුරාර්ය සත්‍යයන් අවබෝධ කරගෙන අමා මහා නිවනින් නිවී සැනසී නිවන ස්පර්ශ කරගෙන නිවී යන්න ලැබේවා! නිර්වාණ අවබෝධය පිණිස මේ උතුම් ධර්මය ඇසීමේ පින හේතු වාසනා වේවා! කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මෙතැනදී ආරම්මණ පුරෙජාත කියන කොට අරහා චක්ඛුං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති කියන තැනදී මට හිතුනේ ඒ රහතන්වහන්සේගේ මහා ක්‍රියා සිතට අරමුණු වෙන්නේ ඇත්ත වශයෙන්ම රූපයක්ද නැත්නම් ප්‍රඥප්තියක්ද කියන එක. ඇත්තටම අපි ගැන හිතුවොත් මම ඇස් දෙක වහගෙන ඇස ගැන හිතුවොත් මම කලින් දැන ගත්ත දැනුමක් මෙනෙහි කරනවා කියන ගතියක් තිබෙනවා. ඇත්තටම ඇස ගැන එතෙන්දි රූපයක් හැටියට මනසට යෙදෙන්නේ නැති බවක් තිබෙනවා. යමක් දිහා කෙලින්ම බලාගෙන ඒක අනිත්‍යයි කියලා මෙනෙහි කරනවානම් මට තේරෙනවා එහෙම නම් ඒ වස්තුවම තමයි බලාගෙන අනිත්‍යයි කියලා අරමුණු කරන්නේ කියලා. නමුත් මේ ඇස කන නාසය දිව කය කියන එක ගත්තහම එහෙම පුළුවන්ද කියලා හිතෙනවා. එතකොට ස්වාමීන්වහන්ස ඒ වර්තමාන රූපයද අරමුණු කරන්නේ නැත්නම් යම් කිසි ප්‍රඥප්ති මාත්‍රයක්ද එතැන අරමුණු වෙන්නේ කියන ප්‍රශ්නය තමයි ආවේ. ඒක පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - සැමදෙනාටම මේක ප්‍රයෝජනවත් වූ ප්‍රශ්නයක් හැටියට මට දැනෙනවා. මේකට උත්තරය බුදුරජාණන් වහන්සේගේ දේශනාවේම තිබෙනවා. අපි දන්නවා ඒක. ජයන්ත මහත්තයත් දන්නවා. ඒක නැවත පොඩ්ඩක් හාරලා අවුස්සලා ඉස්සරහට දාන එක විතරයි මම කරන්නේ.

ප්‍රඥප්තිය අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් මෙනෙහි කරන්න බෑ. ඒක වෙන්නේ නෑ. ඕකේ වෙන්නේ අපි ප්‍රඥප්තියක් රූපකට කොටලා තිබෙනවා. ඒ රූපයකට ඇස කියලා හරි

එහෙම නැත්නම් කන කියලා හරි සරලව ගත්තොත් ඒ පුද්ගලයා අපි හිතමු ජිනදාස කියලා. ජිනදාස කියලා කියන්නේ ප්‍රඥප්තිය. යම් කිසි අඩි කීපයක් උස ඒවාගේම යම්කිසි කට හඬ ස්වරූපයක් තිබෙන්නා වූ නාම ධර්ම ටිකක් ජිනදාස කියන ප්‍රඥප්තියෙන් වහ ගන්නවා. ඒ ජිනදාස කියන වචනයෙන් ජිනදාස කියන ප්‍රඥප්තියෙන් රූප කයත් වහ ගන්නවා. ඒ කට හඬ ජිනදාගේ ඒ රූපය ජිනදාසගේ ගමන ජිනදාසගේ කියලා ප්‍රඥප්තියෙන් ඕක වහගන්නවා. වහගත්ත දෙයක් අපි අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් මෙනෙහි කරන්න ගියාට පස්සේ අපිට හිතෙනවා 'මම මේ ජිනදාස කියන ප්‍රඥප්තියද අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නේ නැත්නම් ජිනදාස වශයෙන් හඳුන්වා තිබෙන නාම කයද රූප කයද අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නේ' කියලා සැකයක් ඒවාගේම අපැහැදිලි කමක් ඇතිවෙනවා. මේකේ සරලව තිබෙන්නේ මෙහෙමයි.

බුදුරජාණන්වහන්සේම කරුණාවෙන් දේශනා කරනවා **"රූපං ජීරති මච්චානං, නාමගොත්තං න ජීරති"** කියලා. ඒ කියන්නේ නාම ගෝත්‍ර වූ ප්‍රඥප්ති කැලි දිරන්නේ නැතිලු. එතකොට ඒ ප්‍රඥප්ති කැලි දිරන්නේ නැතිකොට ඒ ප්‍රඥප්ති කැලි අරගෙන අපිට අනිත්‍යය දුක්ඛ අනාත්ම වශයෙන් මෙනෙහි කරන්න විපස්සනා කරන්න දාන්න බෑ. ඒක නිසා ප්‍රඥප්ති කැලි වලට යටවෙලා තිබෙන්නා වූ ප්‍රඥප්ති වචන වලින් හැංගිලා තිබෙන ආවරණය වෙලා තිබෙන 'රූප ධර්ම' 'නාම ධර්ම' තමයි අපි විපස්සනා කරන්නේ.

ඇත්තටම මෙනෙහි කරගෙන යනකොට ප්‍රඥප්ති කැලි ගැලවිලා විසි වෙලා යනවා හරියට හුළඟට ගහගෙන යන ටකරන් කැලි වගේ, වහලවල් ගලවාගෙන යනවා වගේ ඔය ප්‍රඥප්ති කැලි ගැලවිලා ගිහිල්ලා ඊට පස්සේ ඒ ප්‍රඥප්ති වලට වැහිලා තිබ්ච්ච නාම රූප ධර්ම තමයි ඇත්ත වශයෙන්ම අනිත්‍ය දුක්ඛ අනාත්ම හැටියට මෙනෙහි වෙන්නේ, දකින්නේ, පෙනෙන්නේ සහ ඉදිරිපත් වෙන්නේ. හැබැයි අපි මෙනෙහි කළේ මොකක්ද දැක්කේ මොකක්ද කියලා කාටහරි කියන්න යනකොට අපි ඒ ගලවපු අර ප්‍රඥප්ති කැලි තාවකාලිකව ඒකෙ හයි කරලා මෙන්න මේකයි කළේ කියලා අපිට ප්‍රඥප්තිය ආධාරයෙන් තමයි හඟවන්න තිබෙන්නේ. ඔන්න ඔය සිද්ධිය තමයි මහත්තයා ඕකේ වෙන්නේ. මම හිතනවා මේක මේ පින්වතුන්ට තේරෙන්න ඇති කියලා. තෙරුවන් සරණයි!

<u>ජයන්ත මහත්මයා </u> - අප්‍රමාණ පිං ඒක ඒ ආකාරයෙන්ම තේරුණා ස්වාමීන්වහන්ස. ස්වාමීන්වහන්ස ලබන සතියේ වෙලාවක් තිබුනොත් පැරණි කරුණක් නැවත මතක කර ගැනීමක් හැටියට ස්වාමීන්වහන්ස පටිසම්භිදා මග්ගයෙහි පෙන්නන **'අහුත්වා සම්භූතං, හුත්වා න භවිස්සතීති'** කියන කරුණත් එක්ක මේක අපිට **පුරෙජාත ප්‍රත්‍යයට** ගලපාගන්න හැටිත් අපිට සරලව පැහැදිලි කරලා දුන්නොත් හොඳයි ස්වාමීන්වහන්ස.

එහෙම නම් ඔබවහන්සේට අද දවසේ මේ ආකාරයෙන් අපිට ධර්ම කරුණු මතු කර දීම පිළිබඳව කෘතවේදීව පුණ්‍යානුමෝදනා කරනවා ස්වාමීන්වහන්ස. අපිට ඉතාමත්ම සන්තෝසයි කලකට පස්සේ ඔබවහන්සේ අපිට සම්බන්ධ වීම පිළිබඳව. ඔබ වහන්සේ නැති පාඩුව අපිට දැනුනා සැම බ්‍රහස්පතින්දාවකම විශේෂයෙන්ම. කොහොම නමුත් අපිට හැකි ශක්තියෙන් අපි ඒ කරුණු නැවත නැවතත් මතක් කරගන්න උත්සාහයක යෙදුනා. එහෙම නම් ස්වාමීන්වහන්ස මම ඉතාමත්ම ගෞරවයෙන් යොමු වෙනවා සවනට සිසිලස වෙනුවෙන් ඔබ වහන්සේට මේ වැඩ සටහන නිමා කරන ලෙසට ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි, සැමදෙනාටම තෙරුවන් සරණයි! පිංවත් ලලිත් දළුවත්ත මහත්මයා ඉදිරිපත්වෙලා සත්පුරුෂ හැඟීමෙන් අපේ පින්වත් ජයන්ත රත්නායක මහත්මයා ඉදිරිපත්වෙලා සම්බන්ධීකරණ කටයුතු කිරීමෙන් සත්පුරුෂ සිත් ඇති කල්‍යාණ මිත්‍ර පිරිසක් විසාල වශයෙන් ලෝකේ වටේ එක්කාසු කරගෙන රූපය නොදැක්කත් නොපෙනුනත් හඬ වශයෙන් ඉදිරිපත් කරගෙන අපේ හිතේ තිබෙන්නා වූ දහම් දැනුම ගනුදෙනු කිරීම් වශයෙන් මේ වැඩ සටහන කරගෙන යන්නේ. ඉස්සර කාලේ බඹලොව ඉඳලා දෙව් ලොව ඉඳලා සක්වලවල්වල ඉඳලත් දහම් සාකච්ඡා කිරීම් වශයෙන් ආර්යන් වහන්සේලා බ්‍රහ්මරාජවරු මේ විදියට කරන්න ඇති කියලා අපිට හිතෙනවා. යම් යම් අවස්ථාවලදී බුදුරාජාණන් වහන්සේත් ඒ වගේ භික්ෂූන් වහන්සේලාගේ සිත්වලට කථා කරපු අවස්ථා තිබෙනවා. ඉතින් ඒකත් මේ වගේ ක්‍රමයක් තමයි නමුත් මීට වඩා ඉස්සරහට ගිය ඒවගේම විශේෂයෙන්ම හිතෙන් හිතට සම්බන්ධ වී ගිය ක්‍රමයක්. ඉතින් අපිට ඒ තරම් නැති උනත් ශබ්දය හරහා අපේ දහම් සාකච්ඡා මේ විදියට පවත්වනවා.

ඉතින් මේ වැඩ සටහන බොහොම කාලයක් කරගෙන ආවේ අපේ පින්වත් ලලිත් දළුවත්ත මහත්මයා. ඉතින් ඒ මහත්මයාටත් ජයන්ත මහත්මයාටත් ඒ පවුලේ සැම දෙනාටමත් අසාගෙන සිටි සැම දෙනාටමත් අපි මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. ධර්මඥානය භාවනාමය ඥානය වර්ධනය වේවා! දහම් මනසිකාරය නිරන්තරයෙන්ම ඇති වේවා! සැම තැනකදීම ධර්මයෙන් ජය ගන්න ලැබේවා! සියලු දෙනාගේම දහම් ප්‍රාර්ථනා මුදුන් පමුණුවාගෙන ඒවගේම ජාති දුකෙන් ජරා දුකෙන් මරණ දුකෙන් සෝක පරිදේව දුකෙන් අනන්ත දුක්ඛයන්ගෙන් මිදිලා හේතු ඵල ධර්ම රාමුවෙන් අයින් වෙලා මිදිලා සැම දෙනාටම නිර්වාණ ධාතුව අවබෝධ කරගෙන නිවනින් සැනසෙන්න ලැබේවා! නිවන් අවබෝධය පිණිස ප්‍රඥාව මෝරවාගෙන යන මේ දහම් ගමන ඒ කාන්තයෙන්ම මේ පින්වතුන්ට සැපයක් සැනසිල්ලක් වේවා! නිවනින්ම නිවී සැනසේවා! කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථෙරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.